# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 86— 1973 නොවැම්බර් 16 වැනි සිකුරාද — 1973.11.16

( ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී )

# I වැනි කොටස: (III) වැනි ඡේදය—වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටු | | පිටු |
|---|---|---|---|
| වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම් ... ... ... | 223 | මෝස්තර ආඥාපනත යටතේ නිවේදන ... ... | — |
| වෙළඳ ලකුණු පිළිබඳ නිවේදන ... ... | — | විවිධ දැන්වීම් ... ... ... ... | — |
| පේටන්ට් බලපත්‍ර ආඥාපනත යටතේ නිවේදන ... ... | — | | |



## වෙළඳ ලකුණු පිළිබඳ දැන්වීම්

### වෙළඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළඳ ලකුණුවලට අදාල සියළුම ලියුම් කියුම් කොළඹ 1, ඇවිලන් චතුරශ්‍රයේ 5 වැනි ගොඩනැගිල්ලේ වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ දෙපාර්තමේන්තුවේ වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතුයි.

### පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ වරුවේ දින හැර සෑම ක්‍රියාකාරී දිනකම පෙරවරු නවයේ සිට පස්වරු තුන දක්වාද, සෑම වරුවේ දිනවල පෙරවරු නවයේ සිට පෙරවරු එකොළහයි තිහ දක්වා ද, ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ක්‍රියාකාරි දිනවල පස්වරු දෙක දක්වා ද, වරුවේ දිනවල පෙරවරු එකොළහ දක්වා ද , භාරගනු ලැබේ.

### වර්ණවලට සීමාවූ වෙළඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළඳ ලකුණක් යම් යම් වර්ණයන්ට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමඟ ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

### ආශ්‍රිත කිරීම්

මෙහි පළ කර ඇති වෙළෙඳ ලකුණක් වෙළඳ ලකුණු, ආඥාපනතේ 23 වැනි වගන්තිය (150 වැනි පරිච්ඡේදය) යටතේ තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිත කරනු ලබන බව සඳහන් කර ඇති කල්හි එම වෙළඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

### ''ඒ'' කොටසේ හෝ ''බී'' කොටසේ ඉල්ලීම්

රෙජිස්ටරයේ '' ඒ '' කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම් කිසිම අක්ෂරයක් නොමැතිව කාර්යාලයීය අංකය සමඟ දක්වනු ලැබේ. රෙජිස්ටරයේ '' බී '' කොටසේ ලියාපදිංචි කිරීම සඳහා කරන ඉල්ලීම් කාර්යාලයීය අංකයට මුලින් '' බී '' අක්ෂරය සහිතව දක්වනු ලැබේ.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරයෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

## විරෝධය දැක්වීම

පහත සඳහන් වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීම පිළිබඳව විරුද්ධවීමට හේතු ඇති කවරකු විසින් හෝ මේ ගැසට් පත්‍රය පළ වන දින සිට දෙමසක් ඇතුළතදී රුපියල් 25ක අවලංගු නොකරන ලද හෝ ලාංඡිත මුද්දරයක්ද සමග ටී. ඇම්. 7 දරන පෝරම මගින් විරෝධතා දැන්වීම ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ. රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි සලකනු ලබතොත් විරෝධතා දැන්වීම ඉදිරිපත් කිරීමේ කාල සීමාව ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි උඩ දීර්ඝ කරනු ලැබිය හැකිය.

ලියාපදිංචි කිරීම ඉල්ලුම් කර සිටින තැනැත්තාට තම ඉල්ලීම අස්කර ගන්නට අවස්ථාවක් සැලසෙනු පිණිස, විරෝධතා දැන්වීම පිළියෙල කිරීමේ වියදම් දැරීමට පෙර සෑහෙන ප්‍රමාණ කාලයක් දී ලියවිල්ලකින් දැන්වීමක් එකී ඉල්ලුම්කරු වෙත යවා මිස විධිමත් විරෝධතාවක් ඉදිරිපත් නොකළ හැකිය.

විරෝධතාවක් සම්බන්ධයෙන් ඉල්ලුම්කරු විසින් එරෙහිව කරුණු ඉදිරිපත් නොකළහොත් එසේ විරුද්ධ වන්නකු විසින් ගාස්තු අයකර ගැනීමේ නියෝගයක් සඳහා කරනු ලබන ඉල්ලීමක් ගැන සලකා බැලීමේදී යට කී පරිදි දැන්වීමක් යැවීමේ කාර්ය පැහැර හැර තිබීම ද සැළකිල්ලට ගනු ලැබේ.

---

(1) වෙළඳ ලකුණේ අංකය: 33,398. (2) ලැබුණ දිනය: 1971 මාර්තු මස 6 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු): සුසන්ත විජයසෝම ජයසේකර, එඩ්වින් පෙරේරා ජයසිංහ සහ අනිල් ශ්‍රී ලාල් ගුණවර්ධන (ඒපෙක්ස් ඉන්ඩස්ට්‍රීස් යනුවෙන් ව්‍යාපාරික), අංක 148, කේ. සිරිල් සී. පෙරේරා මාවත, (බ්ලූමැන්ඩල් පාර), කොළඹ 13, නිෂ්පාදකයෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය:————. (5) පන්තිය: 40. (6) බඩු: වීරක්ටර, මෝටර් වාහන සහ කාර්මික යන්ත්‍රෝපකරණ, රබර්වලින් නිපැයුණු අමතර කොටස්, එනම් බුෂ්, ඇඳුතු, ග්‍රීස් සහ තෙල් බූට්ස්, එන්ජින් මවුන්ට්ස්, තෙල් සහ ග්‍රීස් බූට්ස්, රේඩියේටර් නළ, එක්ස් හෝස්ට් මවුන්ටිංග්ස් සහ බැඳුනු රබර්. (7) වෙළඳ ලකුණේ සටහන :

APEX

මෙම වෙළඳ ලකුණ ලියාපදිංචි කරණු ලැබීමෙන් "ත්‍රිකෝණ" සලකුණ වෙනුවෙන් තනි අයිතිය නොලැබේ.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ, 1972 අගෝස්තු මස 23 දින.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

11–654—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

---

(1) වෙළඳ ලකුණේ අංකය : 32,720. (2) ලැබුණ දිනය : 1970 ජූනිමස 5 දින. (3) ඉල්ලුම්කරු (වෙළඳ ලකුණ අයිතිකරු) : ගෙවර්ට-අග්ෆා එන්. වී., අංක බී 2510, මෝට්සල්, බෙල්ජියම ; නිෂ්පාදකයෝ සහ වෙළෙන්දෝ. (4) ලියුම් භාරදීම සඳහා මෙරටෙහි වූ ලිපිනයක් ඇත්නම් ඒ ලිපිනය : ද සිල්වා සහ මැන්දිස් මහතුන්, තැ. පෙ. 884, කොළඹ. (5) පන්තිය : 1. (6) බඩු : ඡායාරූප ශිල්පය, චලන චිත්‍ර ශිල්පය හා විකිරණ ශිල්පය සඳහා සියලුම ආලෝක සංවේදිකර ද්‍රව්‍ය, එනම් කඩදසි, තහඩු සහ පටල, සහ ඡායාරූප සඳහා භාවිතා වන රසායනික නිෂ්පාදන. (7) වෙළඳ ලකුණේ සටහන :

GEVAERT

මෙම වෙළඳ ලකුණ අංක 16,901, 16,909 හා 16,911 දරණ වෙළඳ ලකුණු හා ආශ්‍රිත කරණු ලැබේ.

ආර්. එල්. ද සිල්වා,
වෙළඳ ලකුණු රෙජිස්ට්‍රාර්.

වෙළඳ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව,
කොළඹ,
1973 ජනවාරි මස 20 දින.

11–762—73.11.16 දින අංක 86 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| නොවැම්බර් | ... | 73.11.02 | සිකුරාද | ... | 73.10.26 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.11.09 | සිකුරාද | ... | 73.11.02 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.11.16 | සිකුරාද | ... | 73.11.09 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.11.23 | සිකුරාද | ... | 73.11.16 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.11.30 | සිකුරාද | ... | 73.11.23 | සිකුරාද | දහවල් | 12.00 |
| දෙසැම්බර් | ... | 73.12.07 | සිකුරාද | ... | 73.11.30 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.12.14 | සිකුරාද | ... | 73.12.07 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.12.21 | සිකුරාද | ... | 73.12.14 | සිකුරාද | දහවල් | 12.00 |
| | | 73.12.28 | සිකුරාද | ... | 73.12.21 | සිකුරාද | දහවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 අගෝස්තු මස 18 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.